**ශීර්ෂය - 411 - නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ,අපද්‍රව්‍ය බැහැරලීම හා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

-----------------------------------------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ,අපද්‍රව්‍ය බැහැරලීම හා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ,අපද්‍රව්‍ය බැහැරලීම හා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 01 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 නොවැම්බර් 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ,අපද්‍රව්‍ය බැහැරලීම හා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් ප්‍රකාශය කරමි.

නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ,අපද්‍රව්‍ය බැහැරලීම හා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 වර්ෂයේ ස්ථාපිත කර තිබුණු අමාත්‍යාංශයක් වන බැවින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව ප්‍රකාශ කල නොහැකි අතර ඉකුත් වර්ෂය සඳහා මා විසින් කිසිදු නිර්දේශයක් නිකුත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 3.5 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන කට්ටලය පිළියෙල කිරීමේදී එක් එක් වැය විෂය සංකේතාංකයක් යටතේ සෑම වැය විෂයක් වෙනුවෙන්ම මුළු ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර වෙනස හා එම වෙනසට හේතු ඒසීඒ - 2 (II) හි පෙන්විය යුතු වුවත් වැය විෂයයන් දෙකක් හෝ කිහිපයක් එකතු කර අදාල ආකෘති පත්‍රයෙහි සටහන් කර තිබුණි.

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව සියළු බැරකම් සටහන් කර බැරකම් ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණ අනුව ඉදිරියේදී මේ සඳහා එක ලේඛනයක් නඩත්තු කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කල හැකි වන පරිදි බරකම් ලේඛනයක එම බැරකම් සටහන් කල යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව නිවැරදි දත්ත ඇතුලත් වාහන ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි. තවද අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන හා ක්‍රියාත්මක වී මේ වන විට වසා දැමූ ව්‍යාපෘතින් විසින් පරිහරණය කරනු ලැබූ/ලබන වාහන සම්බන්ධ කිසිදු තොරතුරක් අමාත්‍යාංශ විසින් විගණනයට ඉදිරිපත් නොකල අතර ඒවා අමාත්‍යාංශයේ වාහන ලැයිස්තුවට ඇතුලත් වී නොමැති බවද නිරීක්ෂණය විය. | මේ වන විට අදාල ලේඛනය, ව්‍යාපෘතිවලින් ලබා ගත් වාහන හඳුනාගත හැකි පරිදි යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

**1.6.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර ඇත. අභ්‍යන්තර විගණන ඒකකය මගින් නිකුත්කරන විගණන නිරීක්ෂණ අනුව අදාල වන යාවත්කාලීන කිරීම්,පද්ධති වැඩිදියුණු කිරීම් අමාත්‍යාංශ නිලධාරීන් මගින් අවශ්‍ය කටයුතු සිදුකර ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.6.4 සීමා ඉක්මවීම්**

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් අංක 41101 යටතේ වන අනුමත අවම ලැබීම් සිමාව රු.4,200,000 ක් වුවද අමාත්‍යාංශය මගින් රු.3,999,074 ක් පමණක් අයකරගෙන තිබීම නිසා අවම ලැබීම් සිමාව වෙත ලගාවී නොතිබුණි. | ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් අදාල සීමා සංශෝධනය සඳහා කටයුතු සිදුකර ඇති බවත් ඒ පිළිබද විගණකාධිපතිවරයා දැනුවත් කරන බවත් දන්වා ඇත. | රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම් කටයතු අනුමත සීමා තුල සිදුකල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාග්ධන වැයවිෂයයන් 02 ක් සහ පුනරාවර්ථන වැය විෂයක් සඳහා වර්ෂය තුල සැලසුම් කල පරිදි භාණ්ඩාගාරය විසින් අග්‍රිම නිකුත් නොකිරීම නිසා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු රු. 2,258,391,881 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. | නිරීක්ෂණ සමග එකග වේ. | අග්‍රිම සැලසුම්කරණය තාත්විකව සිදුකල යුතුය. |

### 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුනරාවර්ථන වැය විෂයයන් 04 ක් සඳහා ප්‍රතිපාදිත , එකතුව රු.1,050,000 ක් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 1 ක් සඳහා ප්‍රතිපාදිත රු.10,000,000 ක් සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | නිරීක්ෂණය නිවැරදිය. ඉතිරිවීම්වලට හේතු පැහැදිලිකර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලයීය අවශ්‍යතා වැය විෂය යටතේ අයවැය ප්‍රතිපාදන රු.1,000,000 ක් වූ අතර මු.රෙ.66 මඟින් රු.2,000,000 මුදලක් මාරු කරගෙන තිබුණි.ඊට අමතරව 2020 දෙසැම්බර් 31 දින පරිපූරක ඇස්තමේන්තුවකින් රු.3,700,000 ක මුදලක් ලබා ගෙන තිබුණි. නමුත් මු.රෙ.66 මඟින් මාරු කර ගත් රු.2,000,000 ක මුදල සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | අවශ්‍යතා පැනනොනැගීම නිසා එම මුදල් ඉතිරි විය. | -එම- |

### 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ. 94(1) ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට නොබැඳිය යුතු වුවත් වැය විෂය දෙකකට අදාලව ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවා රු. 1,396,421 ක බැරකම්වලට බැඳීම් ඇති කර ගෙන තිබුණි. | නිරීක්ෂන සමග එකග වේ. අමාත්‍යාංශය යටතේ ඇති නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මගින් යොමුකරන ලද බැරකම් මේ යටතේ දක්වා ඇත. | මු.රෙ. 94(1) ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට නොබැඳිය යුතුය. |

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 702 (3) | අමාත්‍යාංශය විසින් අත්සන් කරන සියළුම කොන්ත්‍රාත්තු ගිවිසුම් පිටපත් තුනකින් අත්සන් කර ඉන් එක් පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත්, අමාත්‍යාංශය විසින් ඇති කරගෙන තිබුණු බැදීම් සනාථ කර ගැනීමට අවශ්‍ය එම බැදීම්වලට එළඹුණු ගිවිසුම් පිටපත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, සණඅපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතිය සහ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම හා සංවර්ධනය කිරීමේ සංස්ථාව යන ආයතන විසින් ඇති කරගත් බැදීම් මේ යටතේ දක්වා ඇත. එම ගිවිසුම් එම ආයතනවලින් පරීක්ෂා කරගත හැකිය. | මුදල් රෙගුලාසිය ප්‍රකාරව කොන්ත්‍රාත්තු පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය |
| (ආ) | 2016 පෙබරවාරි 10 දිනැති අංක ඩීඑම්ජී/එස්පී/2015/01 දරන කළමණාකරණ විගණන දෙපාර්තෙමේන්තුවේ චක්‍රලේඛය | අමාත්‍යාංශය සහ ව්‍යාපෘති කාර්යාල සතු වාහන සම්බන්ධව සමීක්ෂණ පවත්වා නොතිබුණි. | 2021.06.11දින සමීක්ෂණ මණ්ඩලය පත්කර අමාත්‍යාංශය සතු වාහන පිළිබඳව සමීක්ෂණ කටයුතු සිදුකර එහි කටයුතු මේ වන විට අවසන් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය |
| (ඇ) | අංක 30/2016 හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 සහ 3.3 ඡේද | අමාත්‍යාංශය සතු වාහනවල ඉන්ධන දහන පරීක්ෂාව විධිමත්ව සිදු නොවන අතර මාසික ප්‍රවාහන සේවා සටහන අමාත්‍යාංශය සතු කිසිදු වාහනයක් සඳහා නඩත්තු කර නොතිබුනි. | සංචිත වාහන 03 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර ඇත. ඉතිරි වාහාන වල ඉන්ධන දහන පරීක්ෂාව සිදු කෙරෙමින් පවතී.<br><br>මාසික ප්‍රවාහන සේවා සටහනක් පවත්වාගෙන යාමට නිලධාරීන් දැනුවත් කර ඇත. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කල යුතුය. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------------

**3.1** **ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2015 දෙසැම්බර් 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති ගුවන් නගර සංවර්ධන ව්‍යාපෘතිය,බස්නාහිර කලාපීය සැලසුම් ව්‍යාපෘතිය, සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය, තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය සහ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති කාර්යාල පිහිටුවා එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර, මහානගර අධිකාරිය පිහිටුවා නීතිගත කලපසු එම කාර්යාල එම අධිකාරියට පැවරීමට අනුමැතිය ලබාදී තිබුණි. එහෙත් එම ව්‍යාපෘති කාර්යාල 2020 ඔක්තෝබර් 08 දින වසාදමා ඒවායෙහි කාර්යභාරයන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරීමට 2020 ජූලි 24 දින අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කර තිබුණි. මහානගර අධිකාරිය පිහිටුවීම සඳහා අමාත්‍යාංශය විසින් 2020 සැප්තැම්බර් 30 දක්වා රු.1,521,184 ක් වැයකර තිබුණු නමුත් එම අධිකාරිය පිහිටුවා නොතිබුණු බැවින් එම වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | 2015 නොවැම්බර් 30 දිනැති 15/1853/724/018 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් එවකට පැවති මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ එම ව්‍යාපෘති කාර්යාල පිහිටුවා ඇත. එම ව්‍යාපෘති කාර්යාල මගින් ඒ ඒ විෂයපථයන් අනුව කටයුතු කෙරෙමින් පැවති අතර නව රජය බලයට පත්වීමත් සමග එම ව්‍යාපෘතිවලට අදාල විෂයයන් නාගරික සංවර්ධන අධිකාරියට පවරා අදාල කාර්යාල වසා දැමීමට කටයුතු කරන ලදී. | සැලසුම් කල පරිදි, ව්‍යාපෘති නියමිත කාල සීමාව තුල නිමකර අපේක්ෂිත මහජන උපයෝගීතාවය ලබාදීමට කටයුතු කල යුතුය. |
| (ආ) කොළඹ නගරයේ ප්‍රධාන මාර්ගවල පවතින අධික රථවාහන තදබදයට දීර්ඝ කාලීන විසඳුමක් ලෙස කුළුණු මත ඉහලින් දිවෙන සැහැල්ලු දුම්රිය සංක්‍රමන පද්ධති ජාලයක් ස්ථාපිත කිරීම සඳහා, ජපන් ආධාර උපයෝගී කරගෙන 2017 මැයි 01 දින ආරම්භ කර තිබුණි. 2020 වර්ෂ අවසාන වන විට මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් JICA අරමුදල් වලින් රු.මිලියන 4622.45 ක්ද භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් රු.මිලියන 923.18 ක් වශයෙන් රු.මිලියන 5545.63 ක් වැයකර තිබුණි. මෙකී ව්‍යාපෘතිය මිල අධික හා පිරිවැය ඵලදායී නොවන බැවින් ව්‍යාපෘති කාර්යාලය වසාදමා ව්‍යාපෘතිය සතු සියළු | පිලිතුරු ලබාදී නොමැත. | -එම- |

| | | | |
|---|---|---|---|
| | වත්කම් හා බැරකම් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයට හෝ ප්‍රවාහන අමාත්‍යාංශයට පැවරීමට 2020 ඔක්තෝබර් 06 දිනැති අංක අමප/20/1450/312/002 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් දැනුම් දී තිබු බැවින් සිදුකරන ලද වියදම් නිශ්ඵල වියදම් බවට පත්වී තිබුණි. | | |
| (ඇ) | කොල්ලුපිටිය සිට දෙහිවල ඇල දක්වා යෝජිත විනෝදාස්වාද මුහුදු වෙරළ තීරය නිර්මාණය කිරීම, යෝජිත වරාය ආශ්‍රිත ක්‍රියාකාරකම්, කිඹුලා ඇල (බ්ලූමැන්ඩල්) ප්‍රදේශය සංවර්ධනය කිරීම සහ යෝජිත සැපයුම් සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම යන මූලික සංරචක 3 2020 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීම සඳහා බස්නාහිර කලාපීය සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය ස්ථාපනය කර තිබුණි. 2020 ඔක්තෝම්බර් දක්වා මෙම ව්‍යාපෘතිය සඳහා රු. 170,388,967ක් වැයකර ඇති නමුත් වරාය ආශ්‍රිත සැපයුම්සේවා සඳහා වූ බ්ලූමැන්ඩල් ආශ්‍රිත ප්‍රදේශ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සහ යෝජිත වැලිසර සැපයුම් සේවා මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අතහැර දමා තිබුණු බව නිරීක්ෂණය විය. මෙම ව්‍යාපෘතිය 2020 අගෝස්තු 10 දින නාගරික සංවර්ධන අධිකාරියට පවරා තිබුණි. | දෙවන සංරචකයේ බ්ලූමැන්ඩල් කසල අංගණය ආශ්‍රිත ප්‍රදේශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය පමණක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති අතර තුන්වන සංරචකය වත්තල සංවර්ධන සැලැස්මට ඇතුලත් කර ක්‍රියාත්මක කිරීමට පූර්ව අධ්‍යනයක් කිරීමට කටයුතු කර ඇත. | -එම- |
| (ඇ) | විද්‍යා හා තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාලබේ, හෝමාගම, කඩුවෙල අතුරුගිරිය යන නගර පිහිටි ප්‍රදේශය, කලාප 05 කට වෙන්කර සංවර්ධනය කිරීමට අපේක්ෂිතව පැවති අතර මෙය 2017 මාර්තු 01 දින ආරම්භ කර 2023 මාර්තු 01 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. 2020 වර්ෂය තුල රු.මිලියන 238.7 ක් වැයකර එම ව්‍යාපෘතියේ එක් සංරචකයක් වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම යටතේ මාර්ග 04ක් සංවර්ධනය කිරීමට කටයුතු කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා පිහිටුවා ඇති ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කාර්යමණ්ඩල වැටුප් හා දීමනා සහ අනෙකුත් මෙහෙයුම් වියදම් ලෙස 2017 සිට 2020 දෙසැම්බර් 31 අවසන් | මෙම ව්‍යාපෘතිය යටතේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා මාර්ග 4ක් සංවර්ධනය කිරීමට කටයුතු කර ඇත. | -එම- |

වන විට රු. 146,215,139ක් වැයකර තිබුණි. 2020 සැප්තැම්බර් 31 දින මෙම ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරියට පවරා ඇති නමුත් 2021 ඔක්තෝම්බර් 30 දින දක්වා එම ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සිදුවී නොමැති බව නිරීක්ෂණය විය.

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය**<br><br>හෙක්ටයාර 269 ක සමුද්‍රිය භූමි ප්‍රමාණයක් ගොඩකර කොළඹ වරාය නගරය ඉදිකිරිමටද, එම වැඩකටයුතු 2016 ජනවාරි 01 දින ආරම්භ කර 2022 දෙසැම්බර් 31 දින නිමකිරිමටද සැලසුම් කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් රු.මිලියන 6,853.04 ක්ද ව්‍යාපෘති කාර්යාලයේ නඩත්තු කටයුතු වෙනුවෙන් රු.මිලියන 228.7 ක්ද වැයකර තිබුණි.<br>2020 වර්ෂය තුල මෙම ව්‍යාපෘතියේ නිරිත දිග අපජල ප්‍රවාහන පද්ධතියෙන් සියයට 33 ක ප්‍රමාණයක් ඉදිකිරීමට රු. මිලියන 141.07ක්ද උතුරු අපජල ප්‍රවාහන පද්ධතියෙන් සියයට 11 ක ප්‍රමාණයක් ඉදිකිරීමට රු.මිලියන162 ක්ද වෙන්කර තිබුණද 2020 දෙසැම්බර් 31 දින වන විට එහි මූල්‍ය ප්‍රගතිය පිලිවෙලින් සියයට 45 ක් හා සියයට 31 ක් විය. එසේම භෞතික ප්‍රගතිය පිලිවෙලින් සියයට 16 ක් හා සියයට 3.3 ක පහල අගයක් බව නිරීක්ෂණය විය. | 2018 මැයි 18 දිනැති අංක 18/0826/726/035 දරණ අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත අපවිත්‍ර ජලය බැහැර කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘති දෙකම කොළඹ මහනගර සභාව විසින් කරගෙන යාමට නියමිතව පැවති බැවින් 2018 සහ 2019 වර්ෂවලට අවශ්‍ය ප්‍රතිපාදන පලාත්පාලන සහ පලාත් සභා අමාත්‍යාංශය හරහා කොළඹ මහනගර සභාවට ලබාදී ඇත. නමුත් ව්‍යාපෘති දෙකේම ඉදිකිරීම් ඉතා සුළු වශයෙන් සිදුවී තිබුණු අතර මූලික පරිපාලන ,සැලසුම් සහ ටෙන්ඩර් ක්‍රියාවලිය ප්‍රමාද වීම සහ අමතර ප්‍රතිපාදන අවශ්‍යතාවය මීට හේතු වී තිබුණි. මේ සඳහා නැවත කැබිනට් අනුමාතියක් අවශ්‍ය වන අතර එම අනුමැතිය මේ වන තෙක් ලැබී නොමැති බැවින් මෙම ව්‍යාපෘති දෙකේම ඉදිකිරීම් 2020 වසරේ සිට නතර වී ඇත.මේ සඳහා කැබිනට් අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමින් පවතී. | කැබිනට් අනුමැතිය කඩිනමින් ලබාගෙන ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | **අරුවක්කාලු සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය**<br>--------------------------------------<br>අරුවක්කාලු සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ බිම්පිරවුම ඉදිකිරීමේ වැඩකටයුතු 2018 ජනවාරි 01 දින ආරම්භ කර 2019 ජුනි 30 වන විට අවසන් කිරිමට යෝජිතව පැවතියද අවස්ථා 05 කදී දින දීර්ඝ කරමින් පවතින අතර එම කාර්යයන් සඳහා රු. මිලියන 13,646ක් වැයකර තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතියේ සමස්ත ප්‍රගතිය සියයට 79 ක් බව නිරීක්ෂණය විය.<br>මෙම ව්‍යාපෘතිය යටතේ බහාලුම් වැගන් 34 ක් ප්‍රසම්පාදනය කරගැනීම සඳහා ගිවිසුම් කාලය ඉකුත්වීම හේතුවෙන් අවලංගු කර තිබුණි. බහාලුම් පෙට්ටි 94 ක් 2020 වර්ෂය අවසානයේදී ලැබීමට නියමිතව තිබුණද පෙට්ටි රඳවා තබා ගැනීමට සුදුසු ස්ථානයක් වෙන්කරගෙන නොමැති බැවින් ඒවා සැපයීම ප්‍රමාදකරන ලෙස උපදෙස් ලබාදී තිබුණි. දුම්රිය එන්ජින් කට්ටල 04 ක් 2019 දෙසැම්බර් 31 වන විට රු. 8,271,224 ක් වැයකර ආනයනය කරවාගෙන තිබුණු නමුත් කසල හුවමාරු මධ්‍යස්ථාන ඉදිකිරීමේ ප්‍රමාදය හේතුවෙන් 2020 දෙසැම්බර් 31 වන විටද එමගින් අපේක්ෂිත කාර්යයභාරය සඳහා යොදවාගැනීමට නොහැකි වී තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රුපියල් මිලියන 16,186 ක් ගෙවා තිබුණි. | පිලිතුරු ලබාදී නොමැත. | සැලසුම් කල පරිදි නියමිත කාල සීමාව තුල අදාල ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කල යුතුය |

## 3.3 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පලාත් නවයෙහි නගර සංවර්ධන ව්‍යාපෘතිය-<br><br>අමාත්‍යංශයේ 2020 ප්‍රගති වාර්තා අනුව පහත සඳහන් උප සංවර්ධන ව්‍යාපෘති දෙකහි අවම කාර්යසාධනයක් නිරීක්ෂණය විය. | | |
| | (i) රු. මිලියන 5.74 ක ඇස්තමේන්තුගත වටිනාකමකට 2019 ජූලි-01 දින ආරම්භ කර 2020 දෙසැම්බර් 31 දින නිමකිරිමට සැලසුම් කරන ලද දුනුවිල මැද මහනුවර සඳගිරි තපෝවන පිරිවෙන් ගොඩනැගිල්ල ඉදිකිරීමේ කාර්යයෙහි 2020 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 2.64 ක් වැයකර ලබා තිබුණු භෞතික ප්‍රගතිය සියයට 45 ක් විය. | කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය නිසා අතරමගදී කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට සිදුවිය. නැවත කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකෙරෙමින් පවතී. | ව්‍යාපෘති කඩිනමින් නිම කිරීමට කටයුතු කල යුතුය. |
| | (ii) කටුබැද්ද නව මධ්‍යම වෙළඳපල ඉදිකිරීමේ කාර්යය 2019 ජූලි 15 දින ආරම්භ කර-2020 සැප්තැම්බර් 30 දින වැඩ නිමකිරිමට සැලසුම්කර තිබුණ නමුත් ඒ සඳහා මුළු ප්‍රතිපාදනය වූ රු.මිලියන 166.27 න් සියයට සියයක් වැයකර තිබූ නමුත් එහි භෞතික ප්‍රගතිය සියයට 29 ක් පමණක් විය. | කොවිඩ් වසංගත තත්වය සහ වර්ෂාව හේතුවෙන් නියමිත දිනට නිම කිරීමට නොහැකි විය.2021 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට සැලසුම් කර ඇත. | |
| (ආ) | ග්‍රීන් ආකේඩ් මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතිය<br>2017 ඔක්තෝබර් -01 දින ආරම්භ කර 2020 අගෝස්තු 09 දින නිමකිරිමට සැලසුම් කර තිබුණු ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 4,117.09 ක්වූ මෙම නිවාස ව්‍යාපෘතිය සඳහා 2020 වර්ෂය වෙනුවෙන් ප්‍රතිපාදිත රු . මිලියන 16න් 2020 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 15.5 ක් (97%) ක් වැයකර ලබා තිබුණු අතර ව්‍යාපෘතියේ සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 58 ක් පමණක් විය. | මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු විසින් 100%ක් මුදල් වැය කර ව්‍යාපෘතිය නිමකර මාස 06 ක් ඇතුලත පියවීමට යටත්ව කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත. 2020 වර්ෂය තුල මුදල් වෙන්කර තිබුණේ ව්‍යාපෘතියේ උපදේශන හා අනෙකුත් වියදම් සඳහා පමණකි. | -එම- |

**3.4** **විදේශ ආධාර ව්‍යාපෘති**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අරුවක්කාලු සණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ කසල හුවමාරු මධ්‍යස්ථාන, දුම්රිය මාර්ග සහ කසල රදවනය ඉදිකිරීමේ කාර්යය සඳහා කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගැනීමේදී රජයේ සහ ලෝකබැංකු ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව විනිවිදභාවයකින් සිදුකර නොමැති බැවින් නැවත ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට ලෝක බැංකු සමාලෝචන කණ්ඩායම නිරීක්ෂණ ඉදිරිපත් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය කඩිනමින් නිමකල යුතු බවට හේතු දක්වා ප්‍රසම්පාදන කටයුතු නැවත සිදු නොකිරීම හේතුවෙන් ලෝක බැංකුව විසින් එකගවූ ඇමරිකන් ඩොලර් 700,000 ක ලෝක බැංකු ආධාර අහිමි වී තිබුණි. ඒ හේතුවෙන් මෙම ව්‍යාපෘතිය රුපියල් මිලියන 19,127 කට දේශීය අරමුදලින් කිරීමට සිදුව තිබුණු අතර 2020 දෙසැම්බර් 31 වන විට මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන16,186ක වියදමක් රජය විසින් දරා තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත | රාජ්‍ය සම්පත් සුරක්ෂිත වන ලෙස මහජනතාවට උපරිම ඵලදාවක් ලැබෙන අයුරින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කර මුදල් උපයෝජනය කල යුතුය. |

**3.5** **අනාර්ථික ගණුදෙණු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවති ආයතන සහ ව්‍යාපෘති මඟින් ඉටු කරනු ලබන සමාජීය හා ආර්ථිකමය කාර්යභාරය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ ප්‍රචාරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා 2019 වර්ෂයේදී පුද්ගලික ආයතන දෙකක් සමග රු.148,680,879 කට ගිවිසුම්ගත වී ක්‍රියාත්මක කර තිබුණි. එහෙත් ජනතාව දැනුවත් කිරීම වෙනුවට ''පන්නරය '' යන තේමාව යටතේ රටේ සිටින එක් එක් වෘත්තීන් වල | නව රජය බලයට පත්වීමෙන් පසු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පරීක්ෂණයක් සිදු කෙරෙමින් පවතී. | අරපිරිමැසුම්දායි ලෙස මහජන මුදල් වැයකිරීමට කටයුතු කල යුතුය |

| | | | |
|---|---|---|---|
| | යෙදෙන වෘත්තිකයින්ගේ පින්තූර සහිත ප්‍රදර්ශන පුවරු ප්‍රදර්ශනය කිරීම හා ඒ සම්බන්ධ රූපවාහිනි ප්‍රචාරණ දැන්වීම් ඉදිරිපත් කිරීම වැනි කාර්යයන් සඳහා මුදල් වැය කර තිබූ බැවින් මෙම වැඩසටහන සඳහා වැයකර තිබුණු මුදලින් මහජනයාට ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. මෙම ප්‍රචාරණ දැන්වීම් වෙනුවෙන් රු. 53,899,098 ක මුදලක් 2020 දෙසැම්බර් 31 දින වන විටත් අදාල ආයතන වලට ගෙවිය යුතුව පවතින බව නිරීක්ෂණය විය. මෙම ප්‍රචාරණ වැය ආර්ථික නොවන වැයක් ලෙස නිරීක්ෂණය කෙරේ. | | |
| (ආ) | මහකොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය යටතේ දියවන්නා ඔය පුළුල් කිරීම සඳහා අත්‍යාවශ්‍යම ඉඩම් පමණක් පවරා ගැනීම, පවරාගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි මුදල් තක්සේරු කිරීම සහ වන්දි ගෙවීම කඩිනම් කිරීම යනාදි කටයුතු සඳහා අදාල ආයතන ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් පවරාගෙන තිබුණු එක් ඉඩමකට හිමිකම් කියූ විදේශීය සමාගමක් විසින් වන්දි ගෙවීම ප්‍රමාද වීම මත ආයෝජන ආරවුල් නිරවුල් කිරීමේ ජාත්‍යන්තර මධ්‍යස්ථානය වෙත ශ්‍රී ලංකා රජයට එරෙහිව නඩු පවරා තිබුණි. ගොනුකල නඩුව සඳහා විදේශ නීති උපදේශකයන්ගේ සහාය ලබාගැනීම වෙනුවෙන් සහ ඒ වෙනුවෙන් පෙනී සිටි නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ විදේශ ගමන් වෙනුවෙන් සමාලෝචිත (2020) වර්ෂය අවසාන වන විට අමාත්‍යාංශය විසින් රු.342,979,860 ක මුදලක් අනාර්ථිකව වැයකර තිබුණි. නමුත් මේ දක්වාම එම නඩු කටයුත්ත නිමවී නොමැති බවද නිරීක්ෂණය විය. | පිළිතුරු ලබාදී නොමැත. | රාජ්‍ය සම්පත් සුරක්ෂිත කර නාස්තිය වළක්වමින් පවරාගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි මුදල් තක්සේරු කිරීම සහ වන්දි ගෙවීම ප්‍රමාදවීම අවම කිරීමට කටයුතු කල යුතුය. |

## 3.6 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයට අයිතිව පැවති වාහන 09ක් නව අමාත්‍යාංශ ඇතිකිරීමත් සමග වෙනත් ආයතන වෙත පැවරීමට කටයුතු කර තිබුණු අතර වාහන 02 ක් වෙනත් ආයතනවලින් ලබාගෙන තිබුණි. අදාල පැවරීම් කටයුතු 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි සංග්‍රහයේ 11 කොටසේ 8 ඡේදයේ උපදෙස් ප්‍රකාරව සිදුකර නොතිබුණි. | එම වාහන සම්බන්ධයෙන් ඉදිරියේදී සංශෝධිත මුදල් රෙගුලාසි සංග්‍රහයේ උපදෙස් ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. | මහජන දේපල පැවරීම් කටයුතු මු.රෙ ප්‍රකාරව සිදුකල යුතුය. |

## 3.7 මතභේදයට තුඩුදෙන ගණුදෙණු

පහත කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සැහැල්ලු දුම්රිය සංක්‍රමන ව්‍යාපෘතිය නවතා දැමීම නිසා විදේශීය උපදේශන සමාගම විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට තමන්ට සිදුවී ඇති ඇ.ඩො.මිලියන 23.65 ක අලාභ හානි සමඟ අයවිය යුතු මුළු මුදල ඇ.ඩො.මිලියන 31.36 ක් ලෙස දන්වා තිබූ අතර මෙම මුදල අඩුකර ගැනීම සාකච්ඡා කිරීමට සාමාජිකයන් 11 දෙනෙකුගෙන් යුතු කමිටුවක් 2021 පෙබරවාරි 23 දිනැති හා අංක අමප/21/0221/306/015 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පත්කර තිබුණි. එහෙත් 2021 ජුලි අවසානය වන විටත් එම කමිටුවෙන් අදාල නිර්දේශ අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර නොතිබුණි. මෙවැනි ප්‍රමාදයන් මත උපදේශන සේවා ගිවිසුමේ පොදු කොන්දේසි අංක 6.6 අනුව ගෙවිය යුතු මුදලට අමතරව පොළියක් ගෙවීමටද සිදුවන බව නිරීක්ෂණය විය. ණය ගිවිසුම තවදුරටත් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් මෙම මුදල ගෙවීම සම්බන්ධයෙන් මතභේදාත්මක තත්වයක්ද නිරීක්ෂණය විය. | පිලිතුරු ලබාදී නොමැත | රාජ්‍ය සම්පත් හා මහජන දේපල සුරක්ෂිත කිරීම සඳහා වගකීම් පැවරෙන පාර්ශවයක් වශයෙන් කමිටුවේ නිර්දේශ කඩිනමින් ලබාගැනීමට කටයුතු කල යුතුය. |

## 3.8 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරුවක්කාලු සණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා බහාලුම් ප්‍රවාහන ගැල් 34 ක් ප්‍රසම්පාදනය සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කල ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් දේශීය ආයතනයක් තෝරාගෙන තිබුණි. නමුත් ඉදිරිපත් කරන ලද තාක්ෂණික ලංසුවේ දෝෂ පැවතීම නිසා ප්‍රතික්ෂේප කල ලංසුකරුවෙකු විසින් ඉදිරිපත් කල අභියාචනාව සම්බන්ධයෙන් අභියාචනා මණ්ඩලය සහ ජාතික ප්‍රසම්පාදන කොමිසම විසින් සලකා බැලීමෙන් අනතුරුව ටෙන්ඩරය එම ඉන්දියානු සමාගමට ප්‍රදානය කිරීමට නිර්දේශ ලබාදී තිබුණි. කෙසේ වුවද ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට අමාත්‍යවරයා විසින් ඉදිර්පත් කරන ලද අංක 2019/එන්සී/05 හා දිනැති 2019 ජුලි 10 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව, දේශීය අංශය වෙත ප්‍රමුඛතාවය ලබාදීම, විනිමය උච්ඡාවචනයන් නිසා දේශීය සමාගම තෝරාගැනීමෙන් රජයට රු. 37,430,634 ක මූල්‍ය වාසියක් සිදුවීම සහ ඉන්දියානු සමාගම විසින් ඉදිරිපත් කරන ලද තාක්ෂණික ලංසුවේ දෝෂ පැවතීම නිසා ඇගයීම් කිරීමේදී ප්‍රතික්ෂේප වීම ආදී හේතු නිසා අදාල ලංසුකරු ප්‍රතික්ෂේප කල බවද දක්වා තිබුණි. එහෙත් අභියාචනා මණ්ඩලය සහ ජාතික ප්‍රසම්පාදන කොමිසම ලබාදී තිබුණු නිර්දේශට ගරු කරමින් බහාලුම් ප්‍රවාහන ගැල් ප්‍රසම්පාදන ඇණවුම අදාල ඉන්දීය සමාගම වෙත ලබාදීමට කැබිනට් මණ්ඩල අනුමැතිය ඉල්ලා සිටින බව දක්වා තිබුණු අතර ඇණවුම සඳහා ඇ.ඩො.2,373,200 (රු.105,638,000) ක මුදලකට 2019 අගෝස්තු 05 දින අදාල සමාගම වෙත පිරිනමා තිබුණි. කෙසේ වුවද ලංසු ලියකියවිලි අනුව නිෂ්පාදකයා විසින් ප්‍රවාහන ගැල් නිෂ්පාදනය ආරම්භ කිරීමට පෙර සංකල්පීය ඇඳීම් දුම්රිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු විය. එම සමාගම විසින් කිහිපවිටකදීම ඉදිරිපත් කරන ලද සංකල්පීය ඇඳීම්වල නොගැලපීම් හේතුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබුණි. මේ නිසා අදාල බහාලුම් වැගන් නිෂ්පාදනය කර එවීමට එකගවී | පිලිතුරු ලබාදී නොමැත | රාජ්‍ය සම්පත් සුරක්ෂිත වන ලෙස කාර්යක්ෂමව කටයුතු කර ප්‍රසම්පාදන සහ ඇගයීම් කටයුතු නියමිත රෙගුලාසි අනුව විනිවිධභාවයකින් සිදුකල යුතුය. |

තිබුණු දිනය ඉකුත්වී තිබුණි. මේ හේතුවෙන් එම සමාගම සමග ඇතිකරගෙන තිබුණු ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කර තිබුණි.

**3.9 වෙනත් නිරීක්ෂණ**

--------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------------- | ---------------------------------- | ------------ |
| බස්නාහිර කලාපයේ මහනගර සැලසුම් කිරීමේ ව්‍යාපෘතිය 2015 මැයි මස ආරම්භ කරන ලද අතර එය 2017 සැප්තැම්බර් මස නිමකර තිබුණි. ව්‍යාපෘතිය වෙනුවෙන් වැයකර තිබුණු මුළු මුදල රු.330,226,769 ක් විය. කෙසේවුවද 2018 වර්ෂය සිට 2020 සැප්තැම්බර් 30 දක්වා රු. 38,351,301 ක් ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට වැටුප් හා දීමනා ලෙස සහ මෙහෙයුම් වියදම් ලෙස දරා තිබුණි. බස්නාහිර කලාපීය සැලසුම් ව්‍යාපෘතිය නමින් නව ව්‍යාපෘතියක් ලෙස පැරණි ව්‍යාපෘතියම ඉදිරියට පවත්වාගෙන ගොස් තිබුණු අතර 2020 සැප්තැම්බර් 30 දින මෙම ව්‍යාපෘතිය අවසන් කර නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරීමට කටයුතු කර තිබුණි. | අමාත්‍යමණ්ඩල අනුමැතිය අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා ඇත.ව්‍යාපෘතියේ කාර්යභාරය අවසන් වූ පසු සුළු කාර්යමණ්ඩලයක් මගින් හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට සහයෝගය දීම සිදුකර ඇත. මෙම ව්‍යාපෘතියද අවසන් කර නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇත. | නියමිත කාර්යභාරය නිමකල වහාම ව්‍යාපෘති කාර්යාල වසාදැමීමට කටයුතු කල යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

-------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------------- | ------------------------------ | ------------ |
| මහකොළඹ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ ප්‍රධාන තිරසර සංවර්ධන ඉලක්කය වූ නාගරික සහ අනෙකුත් අපද්‍රව්‍ය කලමනාකරණය සඳහා විශේෂ අවධානයක් යොමුකිරීම තුලින් නගරවල අහිතකර ඒකපුද්ගල පාරිසරික බලපෑම අවම කිරීම සඳහා 2020 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 16,186.34 ක් වැය කර තිබුණි. එහෙත් එම ව්‍යාපෘතියේ මන්දගාමී කාර්යසාධනය නිසා 2020 වර්ෂයේදීද එම ඉලක්කය කරා ලගවීමට අදාල ව්‍යාපෘතියට නොහැකිවී තිබුණි. | පිලිතුරු ලබාදී නැත | සැලසුම් කල පරිදි නියමිත කාල සීමාව තුල අදාල ඉලක්ක සපුරාගෙන මහජන දේපල සුරක්ෂිත කළ යුතු වීම. |